PN/TIN-REG/2024-01
30.01.2024

# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## තම රටින් බැහැරව වසන ශ්‍රී ලාංකිකයන්, ද්විත්ව පුරවැසියන් / විදෙස්ගතව දිවි ගෙවන ස්ථිර පුරවැසියන් 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ ලියාපදිංචි කිරීම

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 102(1) වගන්තිය ප්‍රකාරව, ආදායම් බදු අය කරනු ලැබිය යුතු සෑම තැනැත්තකුම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ලියාපදිංචි විය යුතුය.

ඊට අමතරව, දේශීය ආදායම් පනතේ 102(3) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද 2023/05/31 දිනැති අංක 2334/21 දරන ගැසට් නිවේදනයෙහි, ලියාපදිංචි විය යුතු අතිරේක පුද්ගල ප්‍රභේද සඳහන් වන අතර එයට 2023/12/31 දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ වූ තැනැත්තන් සහ 2024/01/01 දිනට හෝ ඊට පසුව අවුරුදු 18 සම්පූර්ණ වන තැනැත්තන් ඇතුළත් වේ.

2023.05.31 දිනැති අංක 2334/21 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය ශ්‍රී ලංකාවේ **වාසික තැනැත්තන්ට** අදාළ වේ.

**යම් තක්සේරු වර්ෂයක් සඳහා ශ්‍රී ලංකාවේ වාසික තැනැත්තකු වශයෙන් සළකනු ලැබීමේ නිර්ණායක;**
**යම් පුද්ගලයකු**

***(අ) ශ්‍රී ලංකාව තුළ වාසය කරයි නම්;***

***(ආ) එම වර්ෂය තුළ දී ශ්‍රී ලංකාව තුළ කායිකව සිටී නම් සහ එම කායිකව සිටීමේ කාලසීමාවේ හෝ කාලසීමාවල මුළු එකතුව එම වර්ෂය තුළ ආරම්භ වන හෝ අවසන් වන යම් මාස දොළහක කාලසීමාවක් තුළ දී දින එකසිය අසූතුනක් හෝ ඊට වැඩි ගණනක් වේ නම්;***

***(ඇ) එම පුද්ගලයා ශ්‍රී ලංකාවේ රජයේ සේවකයකු හෝ නිලධරයකු වේ නම් සහ එම පුද්ගලයාගේ කලත්‍රයා එම වර්ෂය තුළ විදේශයක ඇත්නම්; හෝ***

***(ඈ) වෙළඳ නැව් පනතේ අර්ථානුකූලව, ශ්‍රී ලංකා නෞකාවක සේවයේ නියුක්තව සිටින්නේ නම්, ඔහු එසේ සේවයේ නියුක්තව සිටින කාලසීමාව තුළ,***

කෙසේ වුවද, 2024 වර්ෂය සඳහා වන රජයේ අයවැය මගින් ශ්‍රී ලංකාව තුළ පහත සඳහන් කටයුතු සිදු කිරීමේදී බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක (TIN) අවශ්‍යතාව අනිවාර්ය කිරීමට යෝජනා කර ඇත. එමනිසා, එවැනි කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරනු ලබන ඕනෑම නිර්වාසික තැනැත්තකු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ලියාපදිංචි වන ලෙස දැනුම් දෙනු ලැබේ.

- ***ජංගම ගිණුමක් විවෘත කිරීම***
- ***ගොඩනැගිලි සැලසුමක් සඳහා අනුමැතිය ලබා ගැනීම***
- ***මෝටර් රථයක් ලියාපදිංචි කිරීම, ආදායම් බලපත්‍රය අළුත් කිරීම***
- ***ඉඩම් සඳහා හිමිකම් ඔප්පු ලියාපදිංචි කිරීම.***

(ලියාපදිංචිවීමේ ක්‍රියාපටිපාටිය සඳහා www.ird.gov.lk දේශීය ආදායම් වෙබ් අඩවියේ පළ කරන ලද 2023/12/27 දිනැති නිවේදනය බලන්න- ප්‍රයෝජනවත් තොරතුරු: ප්‍රවෘත්ති/ දැන්වීම්)

වැඩිදුර විස්තර සඳහා කරුණාකර 1944 ඔස්සේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඇමතුම් මධ්‍යස්ථානය අමතන්න.

**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

*බදු- වඩා හොඳ අනාගතයක් සඳහා*